මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

LAE\2023\ 52 2023.06.14

**ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ග්‍රාම නිලධාරී ඔබගේ නිවසට මේ දක්වා නොපැමිණියේ නම් නොපමාව ඔහු අමතන්න.**

2023 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම මේ දිනවල සිදු කෙරේ.

**ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය - 2023**

2023 පෙබරවාරි 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන; එනම් 2005 ජනවාරි 31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන් 2023 ප්‍රධාන නාමලේඛනයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලබයි.

ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘති පත්‍රයක් (BC ආකෘති පත්‍රයක්) සෑම ගෘහයකටම ලබා නොදෙන අතර දැනට වලංගු නාමලේඛනයෙහි එක් එක් ගෘහය යටතේ නම් ඇතුළත් ඡන්දහිමියන්ගේ ලැයිස්තුවක් ග්‍රාම නිලධාරී ඔබගේ නිවසට රැගෙන එන අතර එහි නිරවද්‍යතාව තහවුරු කර ගෘහ මූලික හෝ වැඩිහිටියෙකු එම ලැයිස්තුවෙහි අත්සන් තැබිය යුතුය. එම ලැයිස්තුවෙහි නම සඳහන් තැනැත්තන් තවදුරටත් එම ලිපිනයේම සාමාන්‍ය පදිංචිව සිටින්නේ නම් වෙනත් කිසිදු ආකෘති පත්‍රයක් සම්පූර්ණ කළ යුතු නොවේ.

අවුරුදු 18 සම්පූර්ණ වීම මත, පදිංචිය වෙනස්වීම මත, ප්‍රධාන නාමලේඛනයට ඇතුළත් වීම සඳහා ග්‍රාම නිලධාරී වෙතින් ER ආකෘතියක් ලබාගෙන සම්පූර්ණ කළ යුතුවේ.

**පරිපූරක ඡන්දහිමි නාමලේඛනය**

2024 පෙබරවාරි 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන; එනම් 2006 ජනවාරි 31 හෝ එදිනට පෙර උපන් යොවුන් පුරවැසියන් 2023 (1), 2023 (2) සහ 2023 (3) යන මාස 04 වරක් සකස් කරනු ලබන පරිපූරක ඡන්දහිමි නාමලේඛනවලට ඇතුළත් වීමට සුදුසුකම් ලබති.

2025 වර්ෂයේ පරිපූරක නාමලේඛන සඳහා ඇතුළත් වීමට සුදුසුකම් ලබන තැනැත්තන්; එනම් 2007.01.31 හෝ ඊට පෙර උපන් යොවුන් පුරවැසියන්ගේ තොරතුරු ද, ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

යොවුන් පුරවැසියන් පරිපූරක ඡන්දහිමි නාමලේඛනවලට ඇතුළත් වීම සඳහා ග්‍රාම නිලධාරී වෙතින් YC ආකෘති පත්‍රයක් ලබාගෙන සම්පූර්ණ කළ යුතුවේ.

**වෙනත් කරුණු**

ඡන්දහිමියන් ගණන් ගැනීම පිළිබඳ වැඩි දුර විස්තර අංක 2317/56 හා 2023.02.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ ඇත.

2022 වර්ෂයේ ඡන්දහිමි ලියාපදිංචි විස්තර ග්‍රාම නිලධාරීගෙන්, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් හෝ www.elections.gov.lk නිල වෙබ් අඩවියට පිවිස දැනගත හැකිය. එමෙන්ම විස්තර ඇතුළත් කුඩා පත්‍රිකාවක් ග්‍රාම නිලධාරී විසින් ගෘහ මූලික වෙත ලබාදෙනු ඇත.

**2023 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ග්‍රාම නිලධාරී ඔබගේ නිවසට නොපැමිණියේ නම් නොපමාව ඔහු විමසන්න. ඡන්දහිමියන් ගණන් ගැනීමේ ER හා YC ආකෘති පත්‍ර ග්‍රාම නිලධාරීගෙන් ලබාගත හැකිය.**

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්